කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2021

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

பொதுத் தொழில்முயற்சிகள் திணைக்களம்

நிதி அமைச்சர்

Department of Public Enterprises

Ministry of Finance

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය **1**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 4

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 4

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **5**

පරිච්ඡේදය 03 – 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මුල්‍ය කාර්යසාධනය **7**

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 7

3.2 මුල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 8

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 9

3.4 මුල්‍ය ප්‍රකාශ සටහන් 10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 10

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 11

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන 11

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 11

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 12

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක **22**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) **22**

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **26**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 26

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 28

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **29**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 29

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන ආකාරය 29

6.3 මානව සම්පත් සංවර්ධනය 29

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **30**

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි[1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මූල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, වරාය, පොදු ප්‍රවාහන, ගුවන් සේවා හා ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීමිත ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යාපාර 417 ක් අතරින් ව්‍යාපාර 49 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යාපාර[2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යාපාරවලින් 300 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යාපාර 117 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

1.2. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

මෙහෙවර

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

අරමුණු

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම

1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

2.සේවා සහ භාණ්ඩ විකිණීම මඟින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාලව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

1.4. සංවිධාන සටහන

අති.අ.ජ.	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අ	-	අධ්‍යක්ෂ
නි.අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ.	-	සහකාර අධ්‍යක්ෂ
පරි.නි.	-	පරිපාලන නිළධාරී
සං.නි.	-	සංවිර්ධන නිළධාරී
මු.වි.	-	මූල්‍ය විශ්ලේෂක
කළ.ස.	-	කළමනාකරණ සහකාර
කා.කා.ස.	-	කාර්යාල කාර්ය සහයක



1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- කෘෂි කාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කාර්මික අංශය
- පාලන හා ගිණුම් අංශය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නොවේ

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

2. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2021 වසරෙහි ලබාගත් ප්‍රගතිය, එයින් රටට හා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ 2022 වසරේදී ලභාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල වුවද ජලය, විදුලිය, එන්නත් ඇතුළු ඖෂධ, ගුවන්සේවා, ඉන්ධන සහ විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සහන කාල ලබා දෙමින් බැංකු සේවාවන් වැනි අත්‍යවශ්‍ය සේවාවන් සපයමින් ජනතාවගේ ජීවන තත්ත්වය හා ජීවන මාර්ගයන් සුරක්ෂිත කිරීමට කැපීපෙනෙන භූමිකාවක් ඉටු කිරීමට රජය සතු ව්‍යාපාර මෙහෙය වීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමත් විය.

2021 වර්ෂයේදී රජය සතු ව්‍යාපාර අතුරින් රාජ්‍ය ව්‍යාපාර 23කින් රුපියල් මිලියන 25,919 ක අයබදු ආදායමක් රැස්කර ගැනිමට හැකියාව ලැබී ඇත.එය එම වර්ෂයේ මුලික ඇස්තමේන්තුවට අනුව සියයට 95 ක ප්‍රමාණයක් වේ.කෙසේවෙතත් 2020 වර්ෂය සමඟ සැසඳීමේදී එයට සාපේක්ෂව සියයට 75 ක වර්ධනයක් 2021 වර්ෂයේදී ලබාගෙන ඇති බව නිරීක්ෂණය කල හැකිය.එසේම ලාභාංශ ආදායම ගත් විට 2021 වර්ෂයේදී රුපියල් මිලියන 4672 ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර,එය එම වර්ෂයේ මුලික ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 90 ක ප්‍රමාණයකි.

2022 වර්ෂයේදී රජය සතු ප්‍රධාන ව්‍යාපාරයන්ගෙන් අයබදු රු.මිලියන 38,000 ක් හා ලාභාංශ ආදායම වශයෙන් රු.මිලියන 7,000 ක් ලබා ගැනිමට අපේක්ෂා කෙරේ.

තවද,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාරයන්හි මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා අන්තර්ජාලය පාදක කරගත් පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැකසීමේ ක්‍රියාවලිය අවසන් කර ඇත. මෙමඟින් මූලික තොරතුරු සහ මූල්‍ය තොරතුරු එක් ස්ථානයක ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි.මෙම පද්ධතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර අතර සන්නිවේදන මෙවලමක් ලෙස ක්‍රියා කරන අතර රාජ්‍ය ව්‍යාපාර කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස විශ්ලේෂණය කිරීම, අධීක්ෂණය කිරීම, වාර්තා සකස් කිරීම සහ ජාතික අවශ්‍යතා සමඟ සමපාත වන ආයතනික දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය කාලානුරූපී දත්ත සපයනු ලබයි.

2021 දෙසැම්බර් අවසානය වන විට රාජ්‍ය ව්‍යාපාර 100 ක මුලික තොරතුරු පද්ධතියට ඇතුළු කරන ලදී. 2016, 2017, 2018, 2019, 2020 සඳහා සියලුම ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 ක මුලික දත්ත, වාර්ෂික දත්ත පිරවීම සම්පූර්ණ කර ඇති අතර 2021 ජූලි මාසයේ සිට පද්ධතියට මාසික දත්ත ආකෘති ඇතුලත් කිරීම ආරම්භ කර ඇත. ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 න් 15 ක මුලික දත්ත සම්පූර්ණ කර අතර, පසුගිය වසර පහ සඳහා මූල්‍ය දත්ත පද්ධතියට ඇතුළත් කර අවසන් කර ඇත.

රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීමේ මූලික අරමුණ පෙරදැරි කර ගනිමින් 2021 ඔක්තෝබර් මස මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශයක් ස්ථාපිත කල අතර ඒ සඳහා සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. මෙම අංශයේ අරමුණ වන්නේ රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශලේෂණය කිරීම තුලින් ඒවායේ කාර්යසාධනය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය කටයුතු සිදු කිරීම හා අධීක්ෂණය කිරීමයි. 2021 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ව්‍යාපාර 10 ක මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කර එම ආයතන වල ලාභදායීත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කර අවශ්‍ය මගපෙන්වීම් කර ඇති අතර හඳුනාගත් ආයතන සෘජුව අධීක්ෂණය කිරීමේ කටයුතු වල නියැලී ඇත.

රාජ්‍ය ව්‍යාපාර සඳහා පරිපාලන කටයුතු සහ මූල්‍යමය කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය හා මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය සකස්කර අවසන් කර ඇත.එය රාජ්‍ය ව්‍යාපාර ආයතන සඳහා හඳුන්වා දීමත් සමග එම ආයතන තම ආයතනයට සුවිශේෂී වන පරිදි පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය හා මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය සකස්කර ආයතනයේ කටයුතු සුමටව පවත්වාගෙන යාමට හැකියාව ලැබෙනු ඇත.

මෙහෙයුම් අත්පොත (Operational Manual) සහ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය (Guideline on Corporate Governance) සකස්කර නිකුත් කර ඇති අතර එය 01/2022 චක්‍රලේඛය මගින් බලාත්මක කර ඇත.

පී. ඒ. එස්. අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

3 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එසිජ්-එස්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	2021 රු.	තක්සු නැවත ගලපන ලද 2020 රු.	
32,566,000,000	ආදායම් ලැබීම්		30,590,893,194	17,623,951,941	
	ආදායම් බදු	1	-		
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		එසිජ්-1
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-		
	බදු නොවන ආදායම් හා වෙනත්	4	30,590,893,194	17,623,951,941	
32,566,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**30,590,893,194**	**17,623,951,941**	
-	ආදායම් නොවන ලැබීම්		-	31,424,401,272	
-	භාණ්ඩාගාර අග්‍රිම		35,687,073,655	31,413,874,856	එසිජ්-3
-	නැන්පතු		35,871	70,644	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		7,232,556	6,233,903	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		3,261,492	4,221,869	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**35,697,603,573**	**31,424,401,272**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**66,288,496,767**	**49,048,353,213**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**3,958,969,952**		
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**62,329,526,815**	**49,048,353,213**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-		
63,313,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	62,126,201	64,522,470	
22,012,280	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	21,229,321	16,291,543	එසිජ්-2(ii)
92,815,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	92,702,011	243,823,123	
-	පොළී ගෙවීම්	8	-		
76,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	75,845		
178,216,280	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**176,133,378**	**324,637,136**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-		
900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	890,386	421,355	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		එසිජ්-2(ii)
58,360,051,995	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	54,354,893,957	51,418,407,751	
333,000	හැකියා වර්ධනය	14	333,000	657,000	
-	වෙනත් මූලධන වියදම්	15	-		
58,361,284,995	**මුළු මූලධන වියදම් (උ)**		**54,356,117,343**	**51,419,486,106**	
	නැන්පතු ගෙවීම්		36,146	109,319	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		6,197,931	4,778,054	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**6,234,077**	**4,887,373**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		54,538,484,797	51,749,010,615	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**7,791,042,018**	**(2,700,657,402)**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		7,791,042,018	(2,700,657,402)	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එසිජ්-3
			7,791,042,018	**(2,700,657,402)**	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	35,900,378	35,009,992
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	11,931,975	12,966,600
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		
මුළු වත්කම්		**47,832,354**	**47,976,592**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		11,926,050	12,960,400
දේපළ පිරියත හා උපකරණ සංචිතය		35,900,378	35,009,992
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	5,925	6,200
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**47,832,354**	**47,976,592**

පිටු අංක 07 සිට 51 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 52 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 24/2/22	දිනය : 23/02/2022	දිනය : 23/02/2022
එස්. ආර්. ආටිගල මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය මහලේකම් කාර්යාලය කොළඹ 01.	පී. ඒ. සුසන්ත අතුල කුමාර අධ්‍යක්ෂ ජනරාල් ආර්ථික ව්‍යාපාර දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01.	කේ.ඒ.ජී.කේ. කලවිටිගොඩ සහකාර අධ්‍යක්ෂ (මුදල්) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කොළඹ 01

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සි

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ඉලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු. අධිභාර. දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	3,261,492	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	528,019
අග්‍රිම ලැබීම්	35,687,073,655	31,413,874,856
අත්තිකාරම් අයකර ගැනීම්	3,404,543	2,870,051
නැන්පතු ලැබීම්	35,871	70,644
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**35,693,775,561**	**31,417,343,570**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	62,094,741	78,499,071
සහනාධාර සහ මාරුකිරීම්	114,007,177	243,823,123
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,958,969,952	-
අත්තිකාරම් ගෙවීම්	3,732,509	2,249,540
නැන්පතු ගෙවීම්	36,146	109,319
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**4,138,840,524**	**324,681,053**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**31,554,935,037**	**31,092,662,517**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	31,554,935,036	31,092,662,517
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**31,554,935,036**	**31,092,662,517**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(31,554,935,036)**	**(31,092,662,517)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. **මුදල් හා මුදල් සමාන දෑ**

2021දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.03.00	ලාභ	27,397,000,000	-	25,918,973,951.97	95%
2002.04.00	ලාභාංශ	5,169,000,000	-	4,671,919,242.38	90 %
2006.01.00	වෙනත්	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	602,150,000	178,216,280	176,133,378	98%
ප්‍රාග්ධන	32,003,000,000	58,361,284,995	54,356,117,343	93%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
--	--	--	--	--	--	--

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,047,564.35	1,047,564.35	--	100%
9152	යන්ත්‍රෝපකරණ	20,052,814.04	20,052,814.04	--	100%
9153	ඉඩම්		-		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	අදාළ	-		
9160	කෙරීගෙන යන වැඩ	නොවේ	-		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/A/PED/02/21/01
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2022 ජූනි 06 දින

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යාමය වැරදි

මූල්‍ය ප්‍රකාශන අනුව 2002:03:00 ආදායම් සංකේතයේ හා 2002:04:00 ආදායම් සංකේතයේ දක්වා ඇති මූලික ඇස්තමේන්තුව හා 2021 වර්ෂයේ අනුමත මූලික ඇස්තමේන්තුව අතර පිළිවෙලින් රු.මිලියන 21,603 ක සහ රු.මිලියන 831 ක වෙනසකම් පැවතුණි.

2.1.2 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජූනි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකථනය සහ ඇස්තමේන්තු සකස් කිරීම ඉටු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ආදායම් සංකේතය 20:02:03:00 ලාභ

(i) 20:02:03:00 - ලාභ ආදායම් සංකේත සඳහා 2021 වර්ෂය සඳහා රු.49,000,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු.25,918,973,952 ක ආදායමක් පමණක් රැස් කර තිබුණි.

(ii) 2021 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 05 ක් මඟින් රු.මිලියන 1,800 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යවසායන්වලින් කිසිදු ආදායමක් රැස්කර ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 05 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 6,041 ක ලාභ ආදායමක් ලබා ගෙන තිබුණි.

(iv) පහත සඳහන් රාජ්‍ය ව්‍යවසායන් 06 ක් විසින් පසුගිය වර්ෂ 03කට අධික කාලයක සිට ලාභ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.

- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- ලංකා විදුලිබල මණ්ඩලය
- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

(v) රාජ්‍ය ව්‍යවසායන් 04 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, එම ව්‍යවසායන් විසින් ඇස්තමේන්තු කළ ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 84 ක සිට සියයට 471 ක් දක්වා පරාසයක ප්‍රමානයකින් ලාභ ආදායමට දායක වී තිබුණි.

(ආ) ආදායම් සංකේතය 20.02.04.00 - ලාභාංශ ආදායම

(i) 20:02:04:00 - ලාභාංශ ආදායම් සංකේතය සඳහා 2021 වර්ෂයේදී රු.6,000,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 78 ක් හෙවත් රු.4,671,919,242 ක ආදායමක් පමණක් රැස්කර තිබුණි.

(ii) රාජ්‍ය ව්‍යවසාය 11 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 40 ක සිට සියයට 566 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.

(iii) රාජ්‍ය ව්‍යවසාය 7 කින් ලාභාංශ ආදායම් ලෙස ඇස්තමේන්තු කළ ආදායමට වඩා තථ්‍ය ලැබීමේ අඩුවීම් සියයට 20 ක සිට සියයට 100 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iv) 2021 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය 04 කින් රු.මිලියන 670 ක ලාභාංශ ආදායමක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණත්, ඒම රාජ්‍ය ව්‍යවසායවලින් කිසිදු ලාභාංශ ආදායමක් ලබා දී නොතිබුණි.

(v) පහත සඳහන් රාජ්‍ය ව්‍යවසාය 07 ක් විසින් පසුගිය වර්ෂ කිහිපයකදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි.

- ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව
- Sri Lanka Savings Bank
- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
- කහටගල ග්‍රැපයිට් ලංකා සමාගම
- ලංකා සීනි සමාගම
- ලංකා ලොජිස්ටික් සමාගම
- ලංකා ත්‍රිපෝෂ සමාගම

2.2 වියදම් කළමනාකරණය

2020 අංක 7 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මඟින් 241-01-01-1503 වැය විෂය සඳහා රු.118,240,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන ලබා ගන්නා නිශ්චිත කරුණට එම ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුව තිබුණත්, ඉන් බැහැරව මුදල් රෙගුලාසි 66 හා 69 විධිවිධාන අනුගමන කර එම ප්‍රතිපාදන වලින් රු.26,400,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

2.3 බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) දක්වා ඇති බැරකම් ප්‍රමාණයට අමතරව රු.274,649 ක බැරකම් හා බැඳීම් වලට එළඹ තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 396(ඇ)	2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුම යටතේ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.18,493 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2022 මාර්තු 31 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතුව තිබුණත්, ඊට අදාළ අපහරණ කටයුතු 2022 ජූනි 06 දින වන විටත් අවසන් කර නොතිබුණි.
(ඇ)	2020 අංක 7 දරන විසර්ජන පනත	පනතේ තෙවන උපලේඛණයේ සඳහන් විෂය අංක 24101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අවම ලැබීම් සීමාව රු.3,600,000 ක් වී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට තථ්‍ය ලැබීම් රු.3,404,543 ක් වී තිබුණි. 2022 මැයි 31 දින වන විටත් සීමා සංශෝධනයට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්ය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ කාර්යභාරය පැවැරී තිබුණි. දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණයට ලක්වන රාජ්‍ය ව්‍යවසාය 300 කින් ව්‍යවසාය 119 ක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ තොරතුරු පමණක් විගණනයට ඉදිරිපත් කර තිබුණි. රාජ්‍ය ව්‍යවසාය 181 ක් හෙවත් අධීක්ෂණයට ලක් වන මුළු රාජ්‍ය ව්‍යවසායවලින් සියයට 60 ක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2020 වර්ෂයට අදාලව රාජ්‍ය ව්‍යවසාය 11 ක මූල්‍ය ප්‍රකාශන පමණක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

(ආ) ආරම්භක වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ රාජ්‍ය දැව සංස්ථාව යන රාජ්‍ය ව්‍යවසය 07 ක් සහ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව, ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් ව්‍යවස්ථාපිත ආයතන පාලනය කිරීම පිළිබඳ හොඳම ක්‍රියා පිළිවෙත ක්‍රියාත්මක කිරීම හා ඉන් අනතුරුව, එම පිළිවෙත සෙසු ආයතන සඳහා ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණෙන් 2002 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිස්ථාපනය කර තිබුණි.

විගණනයට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුවේ අධීක්ෂණ ලිපිගොනු තුළ අන්තර්ගත වී තිබුණේ සේවය අවසන් කරන ලද අනියම් කොන්ත්‍රාත් හෝ නුපුහුණු සේවකයන් නැවත සේවයේ පිහිටුවන ලෙස කරන ලද ඉල්ලීම්, නව බැංකු ශාඛා ඇති කරන ලෙස කරන ලද ඉල්ලීම්, නව ATM යන්ත්‍ර ස්ථාපිත කරන ලෙස කරන ලද ඉල්ලීම්, පාරිභෝගිකයන්ගේ පැමිණිලි වැනි කරුණු වේ. එම අන්තර්ගත කරුණු පිළිබඳව හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර අදාල ඉල්ලීම් ආයතනය වෙත යොමු කිරීම පමණක් සිදු කර

නිහ්ුණි. ඒ පිළිබඳව පසු විපරම් කිරීමක්ද සිදු කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඇ) රජය සතුව පැවති පූගොඩ ටෙක්ස්ටයිල්ස් ලංකා ලිමිටඩ ආයතනය 2010 වර්ෂයේදී වසා දැමීමත් සමඟ එම සමාගම සතුව පැවති අංක 223-227, ප්‍රධාන විදිය, කොළඹ 11 ස්ථානයේ පිහිටි පර්චස් 14 – 95 ගොඩනැගිල්ල සහිත ඉඩම මහා භාණ්ඩාගාරය සතු වත්කමක් ලෙස පැවැතුණි. පූගොඩ ටෙක්ස්ටයිල්ස් සමාගම වසා දමන අවස්ථාවේ මෙම ගොඩනැගිල්ල රමෝනා පුද්ගලික සමාගම වෙත වර්ෂ 2 ක් සඳහා බදු ලබාදී තිබුණි. එම බදු කාලය අවසන් වීමත් සමඟ මුදල් අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල පැවති බදුකරු වෙත කෙටි කාලීනව අවස්ථා කීපයකදී බදු ලබාදී තිබුණි. මෙම ගොඩනැගිල්ල භාවිතයට නුසුදුසු තත්ත්වයේ පවතින අතර එය කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවශ්‍ය වන බවත්, ඒ සඳහා රු.මිලියන 120 ක් පමණ වැය කළයුතු බවට බදුකරු විසින් මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි. මේ අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම් කර ගනිමින් මෙම දේපල වසර 15 ක කාලයක් සඳහා දීර්ඝකාලීන බදු පදනමින් රමෝනා (පුද්) සමාගම වෙත බදු දීමට අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට තීරණය කර ඇති බව ලිපි ගොනුව අනුව නිරීක්ෂණය විය. නමුත් මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු වී නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය ඇතුළත් වේ. මහා භාණ්ඩාගාරය විසින් බෝහෝ රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු පත්කර තිබුණද, 2020 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන් 19 කට අදාලව නිකුත් කරන ලද විගණන වාර්තාවල ඇතුළත් නිහිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් 105 ක් අනාවරණය කර තිබුණි. එම නිති, රීති හා රෙගුලාසි ආදියට අනුකූලවන ලෙස කටයුතු කිරීමට රාජ්‍ය ව්‍යවසායන් පෙළඹවීම භාණ්ඩාගාර නියෝජිතයා මගින් සිදු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

3.1 මානව සම්පත් කළමනාකරණය

3.1.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල විස්තර පහත පරිදි විය.

සේවක වර්ගය	අනුමත තනතුරු සංඛ්‍යාව	තථ්‍ය කාර්යමණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	28	22	06
තෘතීක මට්ටම	05	05	00
ද්විතීක මට්ටම	33	29	04
ප්‍රාථමික මට්ටම	16	15	01
එකතුව	**82**	**71**	**11**

2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 11 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2021)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
1. රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය දියුණු කිරීම				
1.1. රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහ මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා මඟ පෙන්වීම සහ නියෝග නිකුත් කිරීම				
ලාභාංශ ප්‍රතිපත්තිය	√			
ප්‍රසාද දීමනා ප්‍රතිපත්තිය	√			
යාවත්කාලීන කරන ලද යහපාලන මාර්ගෝපදේශ	√			
ක්‍රියාකාරී සැලැස්මට සහ අයවැය සැකැසුමට අදාල චක්‍රලේඛ	√			
සාමූහික ගිවිසුම් වලට අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම		√		
ආදායම් ප්‍රතිපත්තියක් සකස් කිරීම	√			
1.2. පරිපාලන අත්පොත් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම				
2. රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය අධීක්ෂණය කිරීම				
2.1. සුවිශේෂ රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීම සඳහා, කණ්ඩායම් නියමුවෙකු, විෂය විශේෂඥයන් සහ විෂය නිලධාරීන්ගෙන් සමන්විත අධීක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම	√			
බඳවා ගන්නා ලද නිලධාරී ප්‍රමාණය	√			
සකස් කරන ලද සමාලෝචන වාර්තා ප්‍රමාණය	√			
2.2. ඉහල,මධ්‍යම,පහල මට්ටම් ලෙස ප්‍රමුඛතාගත අධීක්ෂණ මට්ටම අනුව රාජ්‍ය ව්‍යාපාර කාලීනව අධීක්ෂණය කිරීම				
හඳුනාගත් ගැටලු ප්‍රමාණය	√			
පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	√			
සමාලෝචනය කරන ලද සැලසුම් සංඛ්‍යාව	√			
2.3. දත්ත පද්ධතිය හරහා රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීම				

කළමනාකරණ තොරතුරු පද්ධතිය තුල ඇතුළත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව (සැලසුම් කල පරිදි)	√			
2.4. ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම				
ඇගයීම් කරන ලද සහ විශ්ලේෂණය ලද යෝජනා සංඛ්‍යාව	√			
2.5. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සැපයීම				
නිරීක්ෂණ සහ අදහස් සපයන ලද අමාත්‍යමණ්ඩල සංදේශ සංඛ්‍යාව	√			
2.6. රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/ නිරාකරණය කිරීම				
ලියන ලද ලිපි සංඛ්‍යාව	√			
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව/රැස්වීම් සටහන්	√			
සංවිධානය කරන ලද ආයතන නිරීක්ෂණ චාරිකා සංඛ්‍යාව	√			
3.කොටස්කරුවන්ගේ අභිලාෂය ආරක්ෂා කිරීම				
3.1 ආදායම් ප්‍රතිපත්තියක් සහ 2021 අයවැය සකස් කිරීම	√			
3.2 2021 වර්ෂයේ අයබදු සහ ලාභාංශ එකතු කිරීම	√			
3.3 සහභාගී වූ වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම් සංඛ්‍යාව	√			
3.4. රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති/ බාහිර විගණකවරු ඵලදායි විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම				
ගන්නා ලද පිලියම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව	√			
3.5. මුදල් පනතේ ප්‍රතිපාදන වලට අදාළව රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගේ එකඟතාවය ලබාදීම				
සපයන ලද එකඟතා ලිපි සංඛ්‍යාව	√			
3.6. භාණ්ඩාගාරයේ අභිලාෂයේ ආරක්ෂා කිරීමට යටත්ව, ප්‍රධාන ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම				
අනුමැතිය ලබාදෙන ලද ප්‍රධාන ගනුදෙනු සංඛ්‍යාව	√			
3.7. භාණ්ඩාගාර නියෝජිත රැස්වීම් පැවැත්වීම				
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව	√			
පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	√			

3.8. ප්‍රාදේශීය වතු සමාගම් නියෝජිතයන් සමඟ ස්වර්ණමය හිමිකාරිත්ව රැස්වීම් සංවිධානය කිරීම				
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව	√			
4.මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම				
4.1. පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම.				
සකස් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සංඛ්‍යාව	√			
අදාළ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීම	√			
රාජ්‍ය ව්‍යාපාර විසින් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම	√			
යොමු කරන ලද පසු විපරම් ලිපි සංඛ්‍යාව	√			
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සම්බන්ධයෙන් (මධ්‍යකාලීන/අවසන්)ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ	√			
ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව	√			
4.2. වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම				
අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ලියන ලද නිරීක්ෂණ සංඛ්‍යාව	√			
පාර්ලිමේන්තුවට ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම	√			
ප්‍රමාද වී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල සටහන්	√			
4.3. රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම				
ක්‍රියාත්මක කරන ලද යෝජනා සංඛ්‍යාව	√			
සංවිධානය කරන ලද පසු විපරම් රැස්වීම් සංඛ්‍යාව	√			
4.4. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම				

අදාල ආයතනවලට 2021 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ශ්‍රේණියේ ගිණුම් සහ මුල්‍ය ප්‍රකාශන නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීම	√			
4.5. 2021 කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම				
නියමිත කාලසීමාව තුළ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම	√			
4.6. මුදල් අමාත්‍යාංශයේ 2021 වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාළ පරිච්ඡේදය සකස් කිරීම				
මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාල පරිච්ඡේදය නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම	√			
4.7. 2021 මුල්‍ය කලමනාකරණ වගකීම් පනතට අදාළ වාර්තා සඳහා රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පරිච්ඡේදය සකස් කිරීම				
2021 මුල්‍ය කලමනාකරණ වගකීම් පනතට අදාලව රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය දැක්වෙන පරිච්ඡේදය නියමිත කාලසීමාව තුල ඉදිරිපත් කිරීම	√			
4.8. මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම				
මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	√			
4.9. මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාල පරිච්ඡේදය පිලියෙල කිරීම				
මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	√			
4.10. මධ්‍ය වාර්ෂික මුල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කිරීම				
මධ්‍ය වාර්ෂික මුල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	√			

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
1. ඵලදායිතා ක්‍රියාකාරකම්වලට අනුකූලව ව්‍යවසායකත්ව සහ නිර්මාණශීලීත්වයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම. (SDG.8.3)	• රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහ මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා මඟ පෙන්වීම සහ නියෝග නිකුත් කිරීම	• මෙහෙයුම් අත්පොත (Operational Manual) සහ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය (Guideline on Corporate Governance) සකස් කිරීමට කටයුතු කිරීම			√
	• ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම (12)	• ව්‍යාපාරික යෝජනා සංඛ්‍යාව (12)			√
	• අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සැපයීම (285)	• නිරීක්ෂණ සහ අදහස් සපයන ලද අමාත්‍යමණ්ඩල සංදේශ සංඛ්‍යාව(285)			√
	• ඉහල,මධ්‍යම,පහල මට්ටම් ලෙස ප්‍රමුඛතාගත අධීක්ෂණ මට්ටිම අනුව රාජ්‍ය ව්‍යාපාර කාලීනව අධීක්ෂණය කිරීම (40)	• සමාලෝචනය කරන ලද සැලසුම් සංඛ්‍යාව (40)			√
	• රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/නිරාකරණය කිරීම(122)	• සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව(122) • නිරීක්ෂණ චාරිකා (08)			√

	• රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (15)	• ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා සංඛ්‍යාව (15)			√
2. සියලු සමාගම් තිරසාර සංවර්ධනයක් යොදා ගැනීමට පෙළඹ වීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ ක්‍රියාවලියට තිරසාර තොරතුරු ඒකාබද්ධ කිරීම. (SDG.12.5)	• රාජ්‍ය ව්‍යාපාර වල කාර්යසාධනය අධීක්ෂණය කිරීම (14) • දත්ත පද්ධතිය හරහා රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීම (100)	• සකස් කරන ලද සමාලෝචන වාර්තා ප්‍රමාණය(14) • දත්ත පද්ධතියට ඇතුලත් කල රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව (100)			√ √
3. ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා අනුව තිරසාර මහජන ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම. (SDG.12.7)	• රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති, බාහිර විගණකවරු ඵලදායී විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම (27) • පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම (17) • පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් වලට සහභාගී වීම (15) • වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම (92)	• ගන්නා ලද පිලියම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව (27) • සකස් කල වාර්තා සංඛ්‍යාව(17) • රැස්වීම් සංඛ්‍යාව (15) • ඉදිරිපත් කල වාර්තා සංඛ්‍යාව (92)			√ √ √ √

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමේදී ජයග්‍රහණයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාර සඳහා වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම දැක්විය හැකිය. මෙම පද්ධතිය හඳුන්වාදීමේ පරමාර්ථය වන්නේ රාජ්‍ය ව්‍යාපාර වල අධීක්ෂණ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා රජය සතු ව්‍යාපාර වල වැදගත් තොරතුරු ඇතුලත් කිරීමයි.

2021 දෙසැම්බර් අවසාන වන විට හඳුනාගත් රාජ්‍ය ව්‍යාපාර 100 කින් රාජ්‍ය ව්‍යාපාර දත්ත පද්ධතියට ඇතුලත් කර ඇත. එසේම සියලුම ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 ක මූලික දත්ත ඇතුලත් කිරීම සම්පූර්ණ කර ඇති අතර 2016,2017,2018,2019,2020 සඳහා වාර්ෂික මූල්‍ය දත්ත 2021 ජූලි මස සිට පද්ධතියට ඇතුළත් කිරීම ආරම්භ කර ඇත. ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 න් 15 ක මූලික දත්ත සම්පූර්ණ කිරීමට හැකියාව ලැබී ඇත.

තිරසාර සංවර්ධන අපේක්ෂා ළඟා කර ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාර කාලීන දත්ත නියමිත කාල සීමාව තුල ලබා ගැනීම අප දෙපාර්තමේන්තුවට පවතින ප්‍රධාන අභියෝගයක් ලෙස දැක්විය හැකිය.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	28	22	06
තෘතීයික	05	05	00
ද්විතියික	33	29	04
ප්‍රාථමික	16	15	01

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

නිලධාරීන් විශ්‍රාම යෑම සහ ස්ථාන මාරු ලබා යෑම තුළ මෙම පුරප්පාඩු ඇති වී තිබෙන අතර මෙම තනතුරු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදු කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)	වැඩසටහනේ ස්වභාවය)දේශීය / විදේශීය)		නිමැවුම /ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය	
මූල්‍ය විශ්ලේෂණය හා පුරෝකථනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණවරු-න්ගේ ආයතනය	4	සති 5	80,000.00	දේශීය	-	මූල්‍යමය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා ආයතනවල ලාභදායිත්වය, මූල්‍ය ශක්‍යතාවය සහ කාර්යක්ෂමතාවය කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය දත්ත විශ්ලේෂණය කිරීම පිළබඳ දැනුම
පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ලෙස පවත්වාගෙන යාම	3	දින 1	15,000.00	දේශීය	-	පෞද්ගලික ලිපි ගොනුවක් නිවැරදි ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම
රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් සකස් කිරීම	1	දින 1	5,000.00	දේශීය	-	රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිලධාරින්ගේ වැටුප් ව්‍යුහය, වැටුප් වර්ධක, වැටුප් පරිවර්තනය හා වැඩ බැලීමේ වැටුප් දීමනා සම්බන්ධ දැනුම
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය	1	දින 2	8,000.00	දේශීය	-	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් එහි අවශ්‍යතාවය, නිවැරදිව ක්‍රියාත්මක කිරීම, භාවිතා කළ යුතු ලිපි ලේඛන, ක්‍රමවේද පිළිබඳ දැනුම

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6.	**අභ්‍යන්තර විගණනය**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		